# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 ජූනි මස 19 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

01. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.05 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/vi(1)/18/21)

---

(අ) (i) බස්නාහිර පළාත තුළ 2015 හා 2016 වර්ෂ වල පැවති සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

(ii) එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

(ආ) (i) බස්නාහිර පළාත තුළ 2015 හා 2016 වර්ෂ වල පුරන්ව පැවති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

(ii) එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

(ඇ) (i) බස්නාහිර පළාත තුළ 2015 හා 2016 වර්ෂ වල වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

(ii) එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

- <u>සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්න</u>

02. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.05 දින සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/vi(1)/18/ADG-02)

අ. සමුද්‍ර දේවි විද්‍යාලයේ පළමු වසරේ පන්ති කාමර කියක් තිබේද?

ආ. එම පළමු වසරේ පන්ති කාමර සඳහා ළමුන්ගේ පුරප්පාඩු කියක් තිබේද?

ඇ. මේ වන විට එම පුරප්පාඩු කියක් පුරවා ඇත්ද?

ඈ. එම පුරප්පාඩු පුරවා ඇති ආකාරය කෙසේද?

ඉ. ඉතිරි පුරප්පාඩු කියක් තිබේද? එම පුරප්පාඩු පුරවන්නේ කුමන ආකාරයටද?

03. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/23)

(අ) බස්නාහිර පළාත තුළ ගම්පහ කොළඹ කලුතර යන දිස්ත්‍රික්ක තුනෙහි පවත්නා මගී බස්රථ බලපත්‍ර වලට අමතරව 2018 වර්ෂය සඳහා අලුතෙන් නිකුත් කර ඇති මගී ප්‍රවාහන මාර්ග බලපත් ගණන දිස්ත්‍රික්ක සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) ඒ කුමන මාර්ග අංකයන් සඳහන් පාරවල් සඳහාද?

(ඇ) එකී නව මාර්ග බලපත් නිකුත් කිරීමෙන් බස්නාහිර පළාත් සභා මාර්ගයන්හි ධාවනයේදී නිතර ආරවුල් උද්ගත වන තත්වයක් පවතින බව ඔබතුමා දන්නේද?

(ඈ) මෙම නව බලපත් නිකුත් කර ඇති තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් මොනවාද?

(ඉ) මෙම මාර්ග බලපත් නිකුත් කර ඇත්තේ මාර්ග සඳහා බස් අතිරික්තයක් පවතින අවස්ථාවක බව ඔබ දන්නේද?

(ඊ) මාර්ග ධාවනයේදී ඇතිව තිබෙන මෙම ආරාවුල් සහගත තත්වයන් වළක්වා ගැනීමට ඔබතුමාට හැකිද?

(උ) නොඑසේ නම් ඒ මන්ද?

04. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/24)

---

(අ) කටාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අංක 70/බී කේ.සී ද සිල්වා පුරයේ කටාන ප්‍රාදේශිය සභාව සතු ඉඩමේ අඩක් ඉදිකල ප්‍රජාශාලාව සඳහා පළමු අදියරේදි වෙන් කළ මුදල කොපමණද? කුමන අමාත්‍යාංශයකින්ද?

(ආ) එකී වෙන්කල මුදල් ප්‍රතිපාදන මගින් ප්‍රජා ශාලාව ඉදිකිරීම භාරගත් කොන්ත්‍රාත්කරු කව්ද?

(ඇ) එකී ඉදිකිරීම් අධීක්ෂණ කළ තාක්ෂණ නිලධාරිවරයාගේ නම කුමක්ද?

(ඈ) එකී ප්‍රජා ශාලාව ඉදිකිරීමේ දෙවන අදියර සඳහා වෙන් කල මුදල කොපමණද? කුමන අමාත්‍යාංශයකින්ද?

(ඉ) එකී කටයුතු අධීක්ෂණය කළ තාක්ෂණ නිලධාරිවරයාගේ නම කුමක්ද?

(ඊ) එකී මුල් අදියරේ ඉදිකිරීම් ප්‍රමිතියෙන් යුතුව සිදු කර නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

(උ) ඉහත ගොඩනැගිල්ලට අදල ඉදිකිරීම් පිළිබඳව ඔබතුමා පරික්ෂණයක් කර එකී ඉදිකිරීම් වල සැබෑ තත්වය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

05. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/25)

---

අ. මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ දිවුලපිටිය ඥානෝදය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තනතුර පුරප්පාඩු වී කොපමණ කාලයක් ගතවී ඇත්ද යන්න සභාවට දන්වන්නෙහිද?

ආ. අදළ විදුහලේ විදුහල්පතිවරයෙකු නොමැති වීම නිසා එහි පරිපාලනය අවුල් සහගත වී ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඇ. හිටපු විදුහල්පතිනියට ස්ථාන මාරුවීම් ලබා දී මාස කිහිපයක් ගත වුනද එකී විදුහලට නිත්‍යානුකූලව විදුහල්පතිවරයෙකු පත් නොකිරීමට හේතු සභාවට දන්වන්නෙහිද?

ඈ. එම විදුහලට විදුහල්පතිවරයෙකු පත්කිරීම සම්බන්ධයෙන් ඔබතුමා ක්‍රියාමාර්ගයක් ගන්නේද?

ඉ. නොඑසේ නම් ඒ මන් ද?

06. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/26)

අ. මෙල්කෝ ඔක්සිජන් සමාගම පවත්වා ගෙන යන වත්තල මාබෝල නගර සභාව සතු ඉඩම අවුරුදු 30 කට එම සමාගමට බදු දී ඇති බවත්, මේ වන විට අවුරුදු 15 ක් ගෙවී ඇති බවත් ඔබතුමා පිළිගන්නෙහිද?

ආ. එම ඉඩම මේ වන විට වත්තල මාබෝල නගර සභාව විසින් අදළ සමාගම වෙත විකිණීමට කටයුතු කර ගෙන යන බව ඔබතුමා දන්නෙහිද?

ඇ. ප්‍රදේශයේ පර්චස් 01 ක් රුපියල් ලක්ෂ 45 ත් 50 ත් අතර ප්‍රමාණයකට විකිණෙන නමුත් අදළ ඉඩම ඉතාම අඩු මිලකට මෙල්කෝ සමාගමට විකිණීමට කටයුතු කරන බව ඔබතුමා දන්නෙහිද?

ඈ. පර්චස් 161 කින් යුත් එකී ඉඩම එසේ විකිණීමට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

07. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/27)

අ. වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාබෝල සිට එබේරමුල්ල දක්වා දිවෙන (වැලිකඩමුල්ල පාර) මාර්ගයේ අධිවේගී මාර්ගයේ ගුවන් පාලම අසල කොටස කඩා ඉවත් කරන්නේ කුමක් සඳහාද යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ආ. එසේ එම කොටස කඩා ඉවත් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවසර දුන්නේ කවුරුන්ද යන්නත්, කුමක් පදනම් කර ගෙනද යන්නත් ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ඇ. එසේ එම කොටස කඩා ඉවත් කිරීම මත සුළු ගංවතුරකදී පවා ප්‍රදේශය ජලයෙන් යටවීමට ඉඩ ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. එසේ එම කොටස කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයක් තිබෙන බැවින් මෙම ගැටළුව විසඳීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්න සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

08. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නිතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/28)

---

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ මල නාලිකා වලට අදළ මධ්‍යස්ථාන (Pump Station) කොපමණ තිබේද?

(ආ) උක්ත මධ්‍යස්ථාන පිහිටුවන ලද්දේ කුමන කාල වකවානුවලද?

(ඇ) දැනට කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ ජනතාවගෙන් මලාපවාහනයට අදළව බදු මුදලක් අය කරනු ලබන්නේද?

(ඈ) එවැනි බදු මුදලක් අය කිරීමට කොළඹ මහ නගර සභාව විසින් සැලසුම් කර තිබේද?

(ඉ) එම සැලසුම කුමක්ද? යන්න මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

09. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නිතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/29)

---

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගෙන් කොළඹ මහ නගර සභාව විසින් අය කරනු ලබන බදු වර්ග මොනවාද?

(ආ) එම බදු වර්ග අතරින් එක් එක් බදු වර්ගයට අදළව පසුගිය වසරේ (2017) එකතු කරන ලද මුදල වෙන වෙනම දැක්විය හැකිද? එසේ නම් එම ප්‍රමාණය කොපමණද?

10. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi(1)/18/30)

---

(අ) කොළඹ මහ නගර සභාවට අයත් නගරාධිපති නිල නිවාසයේ වැසිකිළි පද්ධතියක් අළුත්වැඩියා කිරීමක්, වත්මන් නගරාධිපතිතුමිය පත්වීමෙන් පසුව සිදු කරනු ලැබ ඇත්තේද?

(ආ) එසේ නම් ඊට අදළ වියදම් ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කළ හැකිද?

(ඇ) කරන ලද ප්‍රතිසංස්කරණයට සාපේක්ෂව එම ඇස්තමේන්තුව අධික බව ඔබතුමා පිළිගන්නේද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. <u>ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:</u>

" වර්තමානයේ වැඩිහිටියන්ගේ සිට කුඩා ළමයා දක්වා බෝ නොවන රෝග වලින් පෙළෙන අතර එකී රෝග සීඝ්‍රයෙන් වැඩිවීමේ ප්‍රවණතාවක් ඇත. මෙම තත්ත්වය දිගින් දිගටම වර්ධනය වීමට හේතු ලෙස රසායනික ද්‍රව්‍ය අඩංගු ආහාරපාන භාවිතය සහ තාක්ෂණික මෙවලම් භාවිතයට හුරුවීම නිසා මිනිස් සිරුරට ව්‍යායාම් අඩුවීමද හඳුනා ගෙන ඇත. මෙරටේ අනාගතය භාර ගැනීමට සිටින ළමා පරපුර මෙම උපද්‍රව යෙන් බේරා ගැනීමට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව පාසැල් මට්ටමින් වැඩ පිළිවෙලක් දියත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ/vi(i)/18/02)

02. **ගරු නිරෝෂා අතුකෝරළ මන්ත්‍රීතුමිය:**

" වසර 30 ක් පමණ කාලයක් ශ්‍රී ලංකාව තුළ පැවති බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුවෙන් ලක්ෂයකට ආසන්න මිනිස් ජිවිත අහිමි වූ අතර, ඉතා විශාල ආර්ථික හා සමාජ පරිහානියක් සිදුවිය. එකී බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍යයට සමෘධිමත් රටක් ලෙස සංවර්ධනයේ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට තිබූ අවස්ථාවන් අහිමි වූ අතර, විදෙස් රාජ්‍යයන්හි බලපෑමට පවා ලක්වීමට සිදු විය. එකී දුර්දාන්ත කාලවකවානුව අවසන් කරමින් ලක්වැසි සියළු දේශප්‍රේමී ජනතාවගේ සහයෝගය ඇතිව බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීමට ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට හා පොලිසියට හැකි විය. මෙම යුධ ගැටුම් හේතුවෙන් මිය ගිය අය හා සදාකාලික ආබාධිත තත්වයට පත් වූ අපගේ රණවිරුවන් මෙන්ම, නිරායුධ හා අහිංසක සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සිහිපත් කරනු වස් එකී සන්නද්ධ ත්‍රස්තවාදය සහමුලින්ම පරාජයට පත් කළ මැයි මස 18 වන දින "ජාතික සංහිඳියාවේ විරු සැමරුම් දිනය" ලෙස නම් කළ යුතු යැයි ද, කිසිදු ජන කොටසක් අගතියට පත් නොවන ආකාරයට එම සැමරුම අභිමානවත්ව සිදු කළ යුතු යැයිද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි. "

(යෝ/vi(i)/18/03)

XI . සභාව කල් තැබීම.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.06.06 දින
සභා ලේකම් කාර්යාලය
බස්නාහිර පළාතේ පළාත් සභාව
5 වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.